

# FIRE FIVE

අභිරහස් විසදන සුමිතුරෝ පස් දෙනා


තෙසලි චනෝත්මා බෝයගොඩ

8 ශ්‍රේණිය A

# FIRE FIVE

# අභිරහස් විසදන සුමිතුරෝ පස් දෙනා

තෙසලි චනෝත්මා බෝයගොඩ

කතෘ

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

8 ශ්‍රේණිය A

2026 . 06 . 09

978-624-211-450-7

# පිදුම

සමාජයේ අතළොස්සක් පමණ

වූ පාඨකයන්ගෙන්

පොතපත කියවා , පොතක්

ලිවීමට යොමුවන

ඒ අතළොස්සෙනුත් තවත් සීමිත

ප්‍රමාණය අතරට

මා යොමු කළ මාගේ ආදරණීය

දෙමාපියන්,

ගුරුවරුන්ට සහ දයාබර පාසල්

සොයුරියන්ට

'FIRE FIVE අභිරහස් විසදන සුමිතුරෝ පස් දෙනා'

ගෞරවයෙන් පිළිගන්වමි!



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමෙ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10



CamScanner

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන


| | | |
|---|---|---|
| | FIRE FIVE | 01 |
| **01** | **නිවාඩුව ඇරඹෙයි** | **02-03** |
| 02 | රැස්වීමට සූදානම් | 04-05 |
| 03 | රැස්වීම | 06-08 |
| 04 | විනෝද ගමනක් | 09-10 |
| 05 | තවත් රැස්වීමක් | 11-13 |
| 06 | නැවතත් වනාන්තරයට | 14-17 |

# FIRE FIVE

බෙන්- නායකයා

ජුලි

ජේනා

පිටර්

ජැක්







# 01

## නිවාඩුව ඇරඹෙයි...

ඒ අගෝස්තු මාසයේ තවත් එක් දීප්තිමත් දිනයකි. තම පාසල් නිවාඩුව ලැබෙන දින එළඹෙන තෙක් මෙතෙක් දිනක් ඇගිලි ගණිමින් සිටි FIRE FIVE මිතුරන් අද දිනය ගත කරන්නේ දැඩි සතුටකිනි.

සෙල්ලම් කිරීමේ අදහසින් ක්‍රීඩා පිටිය වෙත යමින් සිටි ජූලිට සහ ජෙනාට නොසිතූ මොහොතක නැවතීමට සිදුවූයේ කරදරකාරියකගේ කටහඩිනි. ඒ වෙන කිසිවකගේ නොව ඩේසිගේ කටහඩිනි.

''ජූලි, ජෙනා ටිකක් නවතින්නකෝ'' යි කියා දුවවිත් නැවතුනු ඩේසි ''ඔයාලගේ FIRE FIVE කණ්ඩායමට මාවත් එකතු කරගන්න බැරි ද?'' යැයි විමසුවේ ය.

''ඩේසි අපි දැන් කණ්ඩායම පිහිටුවාගෙන ඕන සාමාජිකයනුත් බදවාගෙන ඉවරයි. ඔයාට තේරෙනවනෙ තවත් කට්ටිය ගත්තොත් අපිට නමත් වෙනස් කරන්න වෙනවා'' ජූලිගේ පිළිතුර විය.

''ඒ වුනත් ඉතින් මාව කණ්ඩායමට ගත්තොත් ඔයාලට කිසි ප්‍රශ්නයක් වෙන්නේ නෑ,නම FIRE SIX කියලා වෙනස් කරන්න එච්චරයි''ඩේසි නැවත තර්ක කරන්නට විය.

''ඩේසි ඔයාට කියන දේ තේරෙන්නෙ නැද්ද? අපි කිව්වනෙ එක සැරයක් ආය සාමාජිකයන් බදවා ගන්නෙ නෑ කියලා විශේෂයෙන්ම ඔයා වගේ කරදර කරන අය''එවර ටිකක් තද පිළිතුරක් ලැබුණේ ජෙනා ගෙනි.

එයින් තවත් කෝපයට පත් ඩේසි ''ඔයාල මාව බදවාගන්නෙ නෑනෙ මම කණ්ඩායමක් හදාගන්නම් ''කියා යන්න ගියා ය.

පන්තියේ නායිකාව ද වූ ඩේසි ඉතා ආත්මාර්ථකාමී මෙන්ම විශාල කරදරයක් ද නිසා බෝහෝ දෙනා ඇයට කැමැත්තක් දැක් වූයේ නැත. එමෙන්ම ජෙනා සහ ජූලි හොඳින්ම දන්නා දෙයක් නම් ඩේසි කිසි දිනක කියන දෙයක් කරන තෙනෙක් නම් නොවන බවයි. බෝහෝ කාලයක සිට කණ්ඩායමට බැදීමට අවශ්‍ය වී තිබූ ඩේසිව කණ්ඩායමට ගැනීමට කිසිවකු කැමති නොවූහ.

කණ්ඩායම් නායකයා වූ බෙන් ද මේ කරදරයෙන් බේරීමට බෝහෝ දේක ර තිබුණි. නමුත් ඩේසි නොවේ උත්සහය අත්හරින්නේ.

ඩේසි නිසා සිදු වූ පරක්කුව නිසා ජූලි සහ ජෙනා ඉක්මනින් දුවවිත් ඔවුන්ගේ යෙහෙළියන් සමග එක් වූහ.''

එසේම එම දිනය ගත වීමත් සමග පාසල් නිම වී නිවෙස් කරා පැමිණීමේ දී ජූලි සහ ජෙනා සමග අනෙක් සගයෝ තිදෙනාද එක් වූහ.

''හෙයි ජෙනා ජූලි ටිකක් ඉන්න'' යි හඬ ඇසුනු ගැහැනු ළමයි දෙදෙනා තම බයිසිකල් නතර කළහ.ඒත් සමගම බෙන්, පීටර් සහ ජැක් ඔවුන් සමග එක් වූහ.

''ඉතිං කොහොමද කට්ටිය? නිවාඩුවත් පටන් ගත්ත නේද?'' බෙන් කීය.

'' අපි ගොඩ කාලෙකින් රැස්වීමක් තිබ්බෙත් නෑ නේද? බෙන් '' ජැක් පැවසී ය.

''ඒක නම් ඇත්ත. අපි ඉක්මනටම රැස්වීමක් පවත්වමුද බෙන් ? මොකද දැන් ඉතින් නිවාඩුවත් පටන් ගත්තනේ'' පීටර් කීය.

'' එහෙනම් අපි ඉක්මනට ම රැස්වෙමු , දවසක්,වේලාවක් මම දන්වන්නම් කොහොම වුණත් හැකි ඉක්මනින් අපි රැස්වීමක් කැදවමු.'' බෙන් කීය.

# 02

## රැස්වීමට සූදානම්

නිවසට පැමිණි පසු බෙන්, සවස තේ පානයෙන් පසු ජෙනා සමග එක් වූයේ රැස්වීම පිළිබඳ කතා කිරීමටයි.

''ජෙනා කවද්ද අපි රැස්වීම තියන්නේ , කොහොමත් ඉක්මනට තියන්න ඕන '' බෙන් කීය.

''අපි හෙටම තියමු '' ජෙනා කීය.

'' ඒක හොදයි හෙට උදේ 10.00 ට පටන් ගමු මඩුව හොදට තියෙනවද දන්නෙ නෑ අපි පණිවිඩ ටික ලියමු ඊට පස්සෙ ඉක්මනට ගිහිල්ලා දීලා එමු ''බෙන් පැවසුවේ ය.

''බෙන් අපි කට්ටියට කන්න, බොන්න මොනවහරිත් ගේන්න කියමුද? මොකද නිවාඩුව පටන් ගත්තට පස්සේ තියෙන පළවෙනි රැස්වීම වගේ ම මේ දවස්වල අපිට විසදන්න අලුත් ගැටලුවකුත් නෑනේ'' ජෙනාගේ අදහස විය.

''එහෙම කරමු එහෙනම් කොළ ටිකයි, පෑන් දෙකකුයි ගේන්න ජෙනා '' බෙන් කීය.

"බෙන් දැන් වේලාව 4.30 යි.අපි ඉක්මනට පණිවිඩ ටික ලියමුනේද? ඉක්මනට ගෙදර එන්නත් එපැයිනේ" ජෙනා කීය.

Fire Five සාමාජිකයින් වෙත,

හෙට එනම් අගෝස්තු 15 වන දින අපගේ රැස්වීමක් පැවැත්වෙන අතර සුපුරුදු මූලස්ථානයේ දී පැවැත්වේ. ඔබ සියලු දෙනාගේ සහභාගීත්වය අනිවාර්ය වේ.

මීට

බෙන්

"මේ ඒක නෙවෙයි බෙන්,මුරපදය මොකක්ද?" ජෙනා ඇසීය.

"ඔයාට හෙට වෙනකම් කල් තියෙනවා ජෙනා මතක් කරොත් මතක් වෙයි"යි කියා බෙන් සහ ජෙනා පණිවිඩ බෙදා දීමට පිටත් වූහ.

මද දුරක් ගමන් කළ පසු බෙන් ජෙනාට යමක් කීමට උත්සාහ කළේය.

''මේ ජෙනා ඔයා දන්නවද? මම ඔයාට කිව්වට මුරපදය මතක් කරන්න හෙට වෙනකල් කල් තියෙනවා කියලා,ඇත්තටම මටත් මුරපදය මොකක්ද කියලා මතක නෑ"බෙන් කීවේ ලැජ්ජාශීලී සිනාවක් පාමිණි.

"ඔයානම් හරි ශෝක් නායකයෙක් වගේම අයියා කෙනෙක් බෙන්" ජේනා කීවේ සිනාසෙමිනි.

"අපි බලමු හෙට මුරපදය මතක් කරගෙන එන්නේ කවුද කියලා එයා තමා හොඳම මතක ශක්තිය තියෙන කෙනා" බෙන් පැවසුවේය.

සෑම සාමාජිකයෙකුට පණිවිඩ බෙදා අවසානයේ දී දෙදෙනා නිවසටපැමිණියහ.

# 03

# රැස්වීම

ජේනා සහ බෙන් උදෑසන 9.30ට පමණ තම මව හමුවීමට ගියේ රැස්වීමට ගෙන යෑමට ආහාරයක් ලබා ගැනීමටයි.

"අම්මේ ,අපට රැස්වීමට කෑමට ගෙනියන්න මොනව හරි දෙන්න පුළුවන්ද?" බෙන් ඇසීය.

"ඔව් ,ඔයාලාට විස්කෝතු හයක විස්කෝතු පැකට් එකකුයි තව ඔයාලාට පුළුවන් ලෙමනේඩ් හදා ගෙන යන්න" අම්මා කීය.

"හරි අම්මේ ස්තුතියි අපි ලෙමනේඩ් හදා ගන්නම් "ජේනා කීය.

ඉන් පසු ජේනා ලෙමනේඩ් සකස් කරන තුරු බෙන් කෝප්ප සූදානම් කළේය. එමෙන්ම වාර්තා පොත සහ බැජ් එකද බෙන් පැළද ගත්තේය. ඒ වන විට ජේනා ලෙමනේඩ් සකසා අවසන් විය.

?ජේනා ඔයා බැජ්එක ගහගත්තද? "බෙන් ඇසීය.

"ඔව්" ජේනා කීය.

"ඔහෙනම් අපි යමු නේද? ඔයා ලෙමනේඩ් එක ගන්න, මම වාර්තා පොතයි විස්කෝතු ගන්නම්"බෙන් කීය.

ඉන් පසු ඔවුහු මඩුව කරා පිය මැන්නෝය.

"ඔයා මුරපදය මතක් කරගත්තද?" යි බෙන් ඇසීය.

නෑ නායකයටත් මතක නැති එකේ අපිටත් අමතක වුනාම මොකද? ජේනා කීය.

ඉන් පසු ඔවුන් මඩුවට පිවිස දොර වසා ගත්තෝය.එසේ ඔවුහු දෙදෙනා අනෙක් සාමාජිකයින් එනතෙක් බලා සිටියහ.පළමුව පැමිණියේ ජූලිය. ඇය පැමිණ දොරට තට්ටු කළාය.

"මුරපදය " බෙන් ඇසීය.

"ගොඩක් කලකින් රැස්වුනේ නැති නිසා මට මුරපදය මතක නැහැ" ජූලි කීය.

දොර විවෘත කළ බෙන් ජූලීට "එන්න ඇතුලට"යි කීවේය.

"බෙන් අද ඇයි ඔයා කිසි ප්‍රශ්නයක් නැතුව ඇතුළට එන්න කිව්වේ "දොර වැසීමෙන් පසු ජූලි ඇසීය.

"නෑ නිකම් මං හිතුව අදට සමාව දෙන්න ඕන කියල" බෙන් කීය

ජෙනා සිනා සී කතා කළාය."බොරු කියන්න එපා බෙන් ඔයාටත් මුරපදය අමතකයි නේ" ජෙනා කී විට බෙන්ගේ මුහුණ රතු විය.ඒත් සමගම ඔහු රවා ජෙනා දෙස බැලීය.ඉන් පසු නැවත දොරට තට්ටු කරන හඬ ඇසිණි. බෙන් නැවත "මුරවචන"යි කීවේය.

"මට මතක නැහැ" ඒ පීටර්ගේ කටහඬයි.ඉන් පසු බෙන් දොර විවෘත කර පීටර්ට ඇතුළට ඒමට ඉඩ සැලසීය.

ඇතුළට පැමිණි විට පීටර් පුදුම සහගත ලෙස අද ඉර පෑයුවේ අනික් පැත්තෙන්ද?යි විමසුවේය.

"නෑ ඉර නම් පෑයුවේ නැගෙනහිරින් ඒ වුණාට මට එහෙම කරන්න වෙනවා මොකද මටත් මුරපදය මතක නැති නිසා" බෙන් කීය.

නැවත දොරට තට්ටු කළේ ජැක් විය යුතුය.බෙන් නැවත "මුරපදය" යි කීවේය.

"ගිණිකෙළි රැය" යි ජැක් පිළිතුරු දුන්නේය.බෙන් දොර විවෘත කළ විගස "මේ ඉන්නේ අපේ කණ්ඩායමේ හොඳම මතකය තියෙන කෙනා" යි කියා අත්පොළසන් දුන්නේය.

පුදුමයට පත් ජැක් "ඒ කොහොම ද එහෙම වෙන්නේ?" යි ඇසුවේය.

"මොකද අපි කාටවත් මුරපදය මතක තිබ්බේ නෑ. ඔයාට විතරයි මතක තිබුණෙ" යි බෙන් පිළිතුරු  දුන්නේය.

"ඔයාටවත් මතක තිබ්බේ නැද්ද බෙන් ? මමත් දසඅතේ කල්පනා කරලා තමයි මතක් කර ගත්තේ "ජැක් කීය.

"ඔව් මට මතක තිබුණේ නෑ හරිකමක් නෑ අපි දැන් රැස්වීම පටන් ගනිමු. ඔයාල ගෙනපු කෑම ටික එහෙම දෙන්න"බෙන් කීය.

පීටර් බනිස් හයක් රැගෙනවිත් තිබුණි.ජුලී බීම බෝතලයක් සහ පෙපර්මින්ට් ද ජැක් චොක්ලට් බිස්කට් පැකට් එකක් ද ගෙනවිත් තිබුණි. මේ සියලු දේ බෙදා ගෙන ඔවුහු එක්ව ආහාර භුක්ති වින්දහ.

"පීටර්,ටොබී කොහේද?"යි ජැක් විමසුවේය.

"එයාට ටිකක් අසනීපයි වගේ "යි පීටර් පැවසුවේය.

"එහෙමද හැබැයි එයාගේ කොටස ඉතුරු වෙලා තියෙනවා" ජෙනා කීය.

"ජැක්ටයි ජෙනාටයි නම් හරි පාළුයි නේ ද?" පීටර් ඇසී ය.

"ඒක නම් ඇත්ත "යි බෙන් කීය."එහෙනම් අපි හරිම රැස්වීම පටන් ගමුද?"යි කියා බෙන් කතාව පටන් ගත්තේ ය."ඔක්කොට ම ඉස්සෙල්ලා මුරවචනය අලුත් කරමු, යෝජනාවක් කරන්න" බෙන් කීය.

"නිවාඩුවත් පටන් ගත්ත නිසා සෙල්ලමක නමක් දාමුද හැංගි මුත්තම් වගේ" ජුලි කීය.

"නැත්තම් කාටවත් හිතෙන්නෙ නැති කහ බිත්තර වගේ එකක් " ජැක් කීය.

"ජැක් ඔයා කිව්වොත් ඔහොම එකක්මයි කමක් නෑ ඒත් ජූලි මම හිතනවා හැංගි මුත්තම් වලට වඩා කහ බිත්තරය හොඳයි කියලා"බෙන් කීය. "අනෙක් අය කැමතිද?" විමසීය. අනෙක් අයද කැමති වූහ."එහෙනම් අපේ අලුත් මුරවචනය කහ බිත්තරය" බෙන් පැවසුවේ ය.

"බෙන් අපිට විසඳන්න ගැටලුවකුත් නෑ අපි මොකද කරන්නේ දැන්?"පීටර් ඇසී ය.

"ඒකත් එහෙම තමා කාට හරි අදහසක් තියෙනවද?" බෙන් ඇසී ය.

"අපි කොහෙ හරි ට්‍රිප් එකක් යමු ද?,ට්‍රිප් එකක් කිව්වට කන්දක් නගින්න නැත්තම් කැලයේ ඇවිදින්න යන්න වගේ දෙයක්" ජෙනා යෝජනා කළා ය.

"ඔහ්, ඒක නම් හොඳ අදහසක් කවුද කැමති ඒ යෝජනාවට?" බෙන් ඇසීය සියලු තම අත් ඉහළට ඔසවා තම කැමැත්ත ප්‍රකාශ කළහ.

"හැමෝම කැමතියි එහෙනම් කියන්න අපි කොහෙද යන්නෙ?"බෙන් විමසුවේ ය.

"අපි යමු අර පරණ තියෙන කන්ද නගින්න මම එතෙන්ට එක සැරයක් ගිහින් තියෙනවා එතන හරිම ලස්සනයි" පීටර් කීය.

"හ්ම්,හ්ම් වෙන මොනවද?" බෙන් විමසීය.

"ආය නිම්බර් වනාන්තරයට චාරිකාවක් යමු, මට හිතෙනවා අපිට එතනදී එක එක සත්තු ගැන,ගස් ගැන ඉගෙනගන්නත් පුළුවන් වගේ ම එතනදී අපිට ටිකක් නිදහසේ ඇවිදින්නත් පුළුවන්" ජූලි කීය.

"මමත් හිතනවා කැලය හොඳයි කියලා" ජැක් කීය.

"හරි එහෙනම් කවුද කැමති කැලේට යන්න?" යි විමසීය. සියලු දෙනා එක පයින් කැමති විය."හරි එහෙනම් හැමෝම කැමතියි නේ ඒක හින්ද අපි කැලේ ගමනක් යමු" බෙන් කීය.

"ඔව් අනිවාර්යෙන් ම" යි සියලු දෙනා එක හඬින් කීය.

"හරි අපි ඊළඟ සතියේ ඉරිදා වගේ යමුද?" බෙන් විමසීය සියලු දෙනාම එම අදහසට එකඟ වූ අතර ජැක් "අපි කීයට විතරද ගමන පිටත් වෙන්නේ?"විමසීය.

"උදේ 8.00 විතර මෙතන මඩුව ළඟින් අපි පිටත්වෙමු හැමෝම බයිසිකල්වල යමු හැමෝම මොනවහරි කන්න,බොන්න ගේන්න"බෙන් කීය."හරි එහෙනම් අපි අදට රැස්වීම නවත්වමු"යෝජනා කළේය.

"හැමෝම පරිස්සමින් ගෙවල්වලට යන්න"ජෙනා කීය.

## 04

# විනෝද ගමනක්

එසේ විනෝද ගමනේ උද්යෝගයත් සමග සතියක් ගත වී ගියේ ය. මෙතෙක් පුරා දින හතක් තුළ FIRE FIVE සගයෝ බලා සිටි දිනය උදා විය.

උදෑසන 8.00 වන විට තම බයිසිකල්වල ඉදිරි කූඩවල කෑම පුරවාගත් පුරවාගත් බයිසිකල් පහක් මඩුව අසල රැස් විය. කණ්ඩායමේ නායක බෙන් කතා කිරීමට පටන් ගත්තේය.

"හරි එහෙනම් අපි කැලේට ඇතුළු වෙන තැනට යනකම් බයිසිකල්වල යමු එතනින් බයිසිකල් නවත්වමු හරිනේ දැන් යමු"බෙන් කී අතර සියලු දෙනා ගමන ආරම්භ කළහ.

කැලයට ළං වූ පසු ඔවුහු පා පැදි එක පෙළට නවතා කූඩ තුළ තිබූ ආහාර තම ඩා ගමන් මලු තුළට දමා ගත්හ. බෙන් "හරි එහෙනම් ගමන පටන් ගනිමු"යි කියා පස් දෙනාම වට වී තම දෑත් එකට තබා "හිප් හිප් හුරේස් හො ද FIRE FIVE " යි කියා බැගසා කැලයට පිවිසුණහ. ටික දුරක් සියලු දෙනා නිහඩවම ගමන් කළෝ ය.

"අපි මේගමන විනෝදයට ආවට මට හිනෙවා මොකක් හරි අභිරහසක් හම්බවෙයි කියලා" බෙන් කීය.

"එහෙම වෙනවානම් කොච්චර දෙයක් ද?"යි පිළිතුරු දුන්නේ පීටර් ය.

කැලයේ අසිරිය විඳිමින් නිහඩවම ඉදිරියට ගමන් කරන යහළුවන් පස් දෙනා නිම්බර් වනාන්තරයේ පිහිටි නිම්බර් මාලිගයට ළගා වූහ. එම මාලිගය දැන් ගරා වැටීමට ලක් වී ඇති නමුත් එය තවමත් අලංකාර එකක් විය. එහි කිසිවෙකුත් නොමැති නිසා සගයෝ එම ස්ථානයට ගොස් ආහාර ගැනීමට තීරණය කළහ.

"අපි ඇතුළට ගිහින් කෑම ගමු" කියා බෙන් පැවසීය.

මාලිගාවේ වත්තට ඇතුළු වූ ඔවුහු මද දුරක් ගමන් කිරීමේ දී චිත්‍ර අඳිමින් සිටි චිත්‍ර ශිල්පියෙක් හමු වූහ.චිත්‍ර ඇඳීමේදී යොදා ගන්නා සායම්,චිත්‍ර කොළ රදවන රදවනයද තිබූ නමුත් ඔහු චිත්‍ර අඳින බවක් නොපෙනින ඔහු දුටු විට,

"හෙයි ඔයා කවුද?" යි බෙන් ඇසීය. එයින් තිගැස්සීමට ලක් වූ ඔහු අතේ තිබී සිතියමක් වැනි යමක් ඉක්මනින් හකුලා කබායට දමා ගත්තේය.ඉන් පසු ඔහු ළමුන් දෙසට හැරී සුහදශීලී ලෙස "මම චිත්‍ර ශිල්පියෙක් ඔය ළමයි කවුද? මෙහෙ මොනවද කරන්නේ?" යි විමසීය.

"අපි මේ වනාන්තරයට විනෝද ගමනක් ආවා,එතකොට ඔයා මොනවද මෙහෙ කරන්නේ ?" යි බෙන් පිළිතුරු දී ඔහුගෙන් ප්‍රශ්න විමසීය.

"මම මෙහෙට වෙලා මේ වටපිටාව චිත්‍රයට නගනවා"යි ඔහු පිළිතුරු දුන්නේය.

"ඔයා රෑටත් මෙහෙ නවතිනවද?" ජැක් ඔහුගෙන් ඇසීය.

"නෑ නෑ මම හවසට ගෙදර යනවා" යි ඔහු කීවත් එය මදක් පැකිලීමෙන් දුන් පිළිතුරකි.

"ආ හරි අපි එහෙනම් ඇතුළට ගිහිල්ල එන්නම්"යි බෙන් කීය.

"ඇතුළට...... ආ හොදයි හොදයි"යි චිත්‍ර ශිල්පියා කීය.

ඉන් පසු ඔවුන් මාලිගයට ඇතුළු වූහ.ඉන් අනතුරුව තම හඩ අවදි කළේ පීටර් ය.

"ඒ මනුස්සයගෙ බතාව ටිකක් සැකයි වගේ නේ ද?" යි හඩ හීන කරමින් කීවේය.

"ඒක නම් ඇත්ත අපි එනකොටම එයා හංග ගත්ත දේ ගැන පොඩ්ඩක් හොයලා බලන්න ඕන" යි බෙන් කීවේය.

"ඒක හොඳයි" ජෙනා කීවේය.

"හරි ආය ඒක ගැන මෙතැන කතා කරන්න එපා "යි බෙන් කීය.

ඉන් පසු සියලු දෙනා ආහාර ගත් අතර ආහාරයෙන් අනතුරුව ඔවුහු මාලිගයේ ඇවිදීමට ගියහ ඒ යන විට ඔවුහු අසාමාන්‍ය දෙයක් දක්නට ලැබිණි.

"මේ මොකක්ද මේ? මේ තරම් කෝටු ගොඩක්" යි ජුලී කීය.

"මං හිතන්නේ මේ මෙහෙ කූඩු හදාගෙන ඉන්න කුරුල්ලන්ගේ කූඩුවල කෝටු කෑලි මම අහල තියෙනවා මෙහෙ ගොඩක් කුරුල්ලො ඉන්නව කියලා "යි ජැක් පැවසුවේය.

"පොඩ්ඩක් ඉන්න මෙතන මොනව හරි හංගන්න එහෙම හොඳ තැනක් මං හිතන්නෙ අර චිත්‍ර ශිල්පියා මෙතන ගොඩක් එහාට ගිහිං තියෙනවා බලන්න මේ අඩි සලකුණු "යි ජෙනා කී අතර ඇය කී ලෙසම එතැන අඩි සලකුණු රැසක් විය.ඒවා දුටු බෙන් එළියට ඇදගත් තම සටහන් පොතේ එම අඩි සලකුණු පිටපත් කර ගත්තේය.

ඉන් පසු ඔවුහු ඇතුළට පැමිණි දොරටුවෙන් පිටව නොගොස් පිටුපස දොටුවෙන් පිට වී වනාන්තරයෙන් පිටවූ අතර බයිසිකල් නවතා තිබූ ස්ථානයට පැමිණියහ.

"අපි හෙට අනිද්දා ම ඉක්මනට රැස් වෙන්න ඕන මම ඒක දන්වන්නම්."යි බෙන් කීවේය.

"හරි බෙන් මට හිතුණා ාඔයා ඉක්මනට ම රැස්වීමක් කැඳවනවයි කියලා" ජැක් කීවේය.

"ඒ කොහොමද? ඔයා ඒක දැනගත්තෙ ජැක් "බෙන් විමසීය.

"ඔයා හැසිරුන විදිහෙන් මට ඒක තේරුණා" ජැක් පිළිතුරු දුන්නේය.

ඉන් අනතුරුව ඔවුහු සතුටින් නිවෙස් වෙත විසිර ගියත් එක් අයෙක් කුතුහලයෙන් ඉතිරෙමින් සිටියේය. ඒ වෙන කිසිවෙක් නොව බෙන්ය.

05

## තවත් රැස්වීමක්

නිවසට පැමිණි පසුව ද චිත්‍ර ශිල්පියා ගැන සිතමිනි. ජෙනා දුටු බෙන් ඇය සමග කතාවකට මුල පිරුවේය.

"ජෙනා එන්නකෝ අද වෙච්ච දේ ගැන ටිකක් කතා කරන්න" බෙන් කීවේය.

"කියන්න බෙන් ඔයා මොකද මේ ගැන හිතන්නේ? මටත් පොඩි අදහසක් තියෙනවා" යි ජෙනා කීය.

"ඔයාටත් අදහසක් ඇති කියලා මට හිතුනා ජෙනා ඔයා කියන්නකෝ" බෙන් කීය.

"මට හොඳටම විශ්වාසයි අර චිත්‍ර ශිල්පියා හංගගත්තේ සිතියමක් මොකද මම ඒකෙ ඊ හිස දැක්කා" ජෙනා කීවාය.

"මමත් ඒක දැක්කා ඔයාට මතකද ජෙනා මේ ළඟදී ජොන්සන් මහත්තයාගේ නිධානය හොයන සිතියමක් හොරකම් කරා මට හිතෙනවා ඒ ඒක කියලා" බෙන් අදහස් දැක්වීය.

"එහෙම නම් අපි ඒක ගැන හොයල බලමු "ජෙනා කීය.

"ඒක තමා මං රැස්වීම කැඳවන්නෙ අද හවස් වුණානේ නැත්තම් මං හවසම රැස් වෙනවා" බෙන් කීය.

"එහෙනම් හෙට උදේම රැස්වෙමු දැන් පණිවිඩ ටික ලියමු "ජෙනා කීය. ඉන් පසු ඔවුහු දෙදෙනා ලියුම් ලිවීම අවසන් කර තම බයිසිකල් වල නැගී ලියුම් බෙදීමට ගියහ.

උදෑසන 8.30ට සුපුරුදු මූලස්ථානයේ දී FIRE FIVE  සාමාජිකයෝ රැස්වූහ.

"අපි අද මේ හදිසියේම රැස්වීමක් කැඳවූයේ ඊයේ  පිට දකින්න ලැබිච්ච දේ ගැන කතා කරන්නයි "බෙන් කීය".ඔයාලටත් තේරෙනවා ඇති එතන මොකක් හරි නොගැළපීමක් තියෙනවා

කියල,හරි මට කියන්න එක එක්කෙනා ඔයාලට ඒ චිත්‍ර ශිල්පියා හංග ගත්ත දේ දැක්ක විදිහ"බෙන් පැවසීය.

---

"සිතියමක්" ජෙනා කීය."සිතියමක්"ජැක් කීය."මම දැක්කේ කුසලානයක් තියෙන කඩදාසියක්"පීටර් කීය."මම දැක්කෙ JK කියලා ගහලා තියෙනවා"ජූලි කීය

"මොකක්ද ජූලි ඔයා කිව්වෙ JK කියලා තිබ්බ කියලා ඔයාට ඒක ගැන හොඳටම විශ්වාසද?"යි පැවසූ බෙන්ට ජූලි හිස සලා එය අනුමත කළේය.

"හරි ජොන්සන් ක්ලැඩිෆ් ,JK ඔයාලට මතකද?ජොන්සන් මහත්මයගෙ නිධානයක් හොයන සිතියමක් මේ ලගදි කවුරු හොරකම් කරා ඒකෙ පිටිපස්සෙත් JK කියලා ලියලා තිබ්බා" බෙන් කීය.

"එහෙනම් අපි ගිහිල්ලා ක්ලැඩිෆ් මහත්මයගෙන් මේ ගැන අහමු" ජූලි කීය.

"මම කියන විදියට වැඩ ටික කරමු ද?" විමසූ බෙන්ට සියලු එකගතාව පල කළහ.

"මෙන්න මෙහෙම කරමු ජූලි පීටර් ඔයයි තැපැල් කාර්යාලයට ගිහිල්ල මේ සිද්ධිය ගැන විස්තර හොයන්න. මම යනවා පොලිස්ථානයට ගිහිල්ලා දැන්වීම් පත්තර බලලා විස්තර හොයනවා. එතකොට ජෙනා ජැක් ඔය දෙන්න ක්ලැඩිෆ් මහත්මයා හම්බ වෙන්න ගිහිල්ල මේ සිද්ධිය ගැන අහන්න හැබැයි අර සිද්ධිය ගැන කියන්න එපා දැන් වෙලාව 9.45යි ඔයාල හැමෝම 10.30 වෙද්දී වැඩ පටන් ගන්න ඕන තේරුනානේ "යි කී බෙන් තම අත මැද මේසය මතින් තැබීය. අනෙක් අයද එක එක මත එක අත් තබා එක හඬින් "FIRE FIVE "යි කීය අවසාන උපදෙස ලෙස බෙන් "හැමෝම 4.30 වෙද්දි ආපසු රැස් වෙමු. එහෙනම් හැමෝටම බායි " කී ය.

විසිරගිය මිතුරෝ සියලු දෙනා උදේ 10.30 වන විට වැඩ කටයුතු ආරම්භ කලහ.

නැවත 4.30 වන විට සියලු දෙනාම රැස්වූහ.පළමුව කතාබහ ඇරඹූ බෙන් "දැන් අපි බලමු ඔයාලා අද දවසේ කටයුතු සාර්ථක ද කියලා පළවෙනියට කියන්නකෝ ජෙනායි ,ජැකයි ඔය දෙන්නගෙ වැඩ කටයුතු ගැන"යි කීය.

ජෙනා කතාව ඇරඹීය "අපි දැන් ක්ලැඩිෆ් මහත්තයා හම්බවෙන්න යනකොට ඔයා ගමනක් ගිහිල්ලා ආව විතරයි ඊට පස්සේ එයා කිව්වා ඔයාලට පුළුවන්ද විනාඩි 10ක් ඉන්න මම ඉක්මනට ඇඳුම් මාරු කරන් එන්නම්" කියලා ඊට පස්සේ අපි එයාගෙ සාලේ තිබ්බ අරුමෝසම් බඩු බලමින් විනාඩි 15ක් විතර හිටියා"

ඔන්න ඊට පස්සේ ක්ලැඩියෆ් මහත්තයා ආවා. "හොඳයි ළමයිනේ ඇයි ඔයාලා මෙහෙ ආවේ කියලා කියමු බලන්න" කියමින් ඔහු සේවිකාවට කිව්වා තේ ලෑස්ති කරන්න කියලා ඊට පස්සේ අපි ආව කාරණය ඔහුට කිව්වා "ආ ඒ ගැන කරුණු කියනව නම් මම හිතනවා ඒක ඇත්තම සිතියමක් කියලා ඒක හොයා ගත්තොත් ලැබෙන ධනයට වඩා මට දුක ඒක මගේ

පරම්පරාවෙන් මට ලැබිල තියෙන නිසා "යි ඔහු කිව්වා මම ඇහුවා ක්ලැඩිස් මහත්තයාගෙන් එදා වෙච්ච සිද්ධිය "මම සාමාන්‍යයෙන් ටිකක් තදින් නින්ද යන කෙනෙක් ඒ නිසා මට කුඩා ශබ්ද කිසිවක් රාත්‍රියට ඇහෙන්නේ නෑ මට එදත් එහෙම මොකුත් ශබ්දයක් ඇහුණේ නෑ කොහොම හරි මම උදෑසන සුපුරුදු පරිදි සාලයට එනකොට මෙන්න මේජනේලය "යි කියා අසල වූ ජනේලයක් පෙන්වමින් "කුඩා අත දැමිය හැකි පරිදි සැකසූ සිදුර දැක්කා ඊට පස්සේ බලන කොට තමා දැක්කෙ සිතියම අතුරුදහන් වෙලා කියලා" ඔහු කිව්වා කියමින් ජැක් කතාව අවසන් කළේය.

"හරි,හොඳයි එහෙනම් දැන් මම කියන්නම් මම දැනගන්න ලැබිච්ච දේවල්" කියමින් බෙන් කතාව පටන් ගත්තේය. "මම පළවෙනියටම බැලුවේ දැන්වීම් පුවරුව ඒකෙනම් එච්චර දෙයක් තිබුණේ නෑ.ඊට පස්සේ මම බැලුවා පත්තර සහ තවත් පත්‍රිකා තිබුණා ඒ ගැන සඳහන් වෙච්ච මම ඒවත් බැලුවා ඒවායේ තිබුණ දේවලින් තවත් සනාත වුණා අපේ උපකල්පනය හරි වගේ කියලා ඒ හොරාට අමතක වීමකින් සහ හදිස්සියට සාක්කුවෙන් දෙයක් වැටිලා මොකක්ද දන්නවද ඒ පේන්ට් ටියුබ් එකක් "කී බෙන් අනෙක් අය දෙස බැලුවේය.

"ඒකනම් හොඳ හෝඩුවාවක" ජැක් කීය.

"හරි දැන් පීටර්,ජුලී හොයාගන්න ලැබිච්ච දේවල් කියන්න" යි බෙන් කීය.

"අපිට කියන්න දෙයක් ඉතිරි වෙලා නෑ කියන්න කියල තියෙන්නේ පත්තරේක තිබ්බ ජනේලයේ තියෙන සිදුර තියෙන උසත් එක්ක ඒ හොරා අඩි 5 අඟල් 5ක් පමණ විය යුතුයි කියලා වෙන කියන්න දෙයක් ඉතුරු වෙලා නෑ "යි ජුලී කීය.

"බෙන් මම ඔයාට කියන්නමයි හිටියෙ අපෙ ගෙදර අපේ කාමරේ ඉඳන් බැලුවම මාලිගාව පේනවා දුරේක්ෂයෙන් බැලුවොත් හැමදේම බලන්න පුළුවන් වෙයි " ජේනා කීය.

"හරි තාත්තාගෙන් දුරේක්ෂය ඉල්ලගෙන දැන් බලමු මොකද කියලා ඊත් එක්කම අපි හෙට උදේම ගිහිල්ල බලන්න ඕන අර වැටිල තිබ්බ ටියුබ් එක paintium එකක් අර චිත්‍ර ශිල්පියා ළඟ තියෙන්නෙත් paintium කියලා බලන්න ඕන ඊට පස්සේ එයාගෙන් තව දේවල් දැනගන්න

ඕන,හරි එහෙනම් හැමෝම හෙට උදේ 8.30 වෙද්දි බයිසිකල් වල මෙතැනට එන්න" යි කී බෙන් රැස්වීම අවසන් කළේය.

# 05

# නැවතත් වනාන්තරයට

සියලු දෙනාම උදෑසන 8.30 වන විට බයිසිකල් වල නැගී මඩුව අසලට පැමිණ සිටියහ.

එහෙනම් දැන් ගමන අරඹමු බෙන් අණ කළේය

මාළිගාවට යාමට වනාන්තරය අසල බයිසිකල් නවත්වා යාමේ දී බෙන් "මමයි ජුලියි අපි දෙන්නා ගිහිල්ලා චිත්‍ර ශිල්පියාගෙන් ප්‍රශ්න අහල කතා කරන්නම් එතකල් ඔය තුන්දෙනා මාළිගාවේ අනෙක් පැත්තේ දොරෙන් ඇතුළට යන්න ඕන චිත්‍ර ශිල්පියාට පේන්නේ නැති වෙන්න ගිහිල්ලා මාළිගාව හොඳින් සෝදිසි කරන්න ඒකේ මොනවද තියෙන්නෙ කියලා ඊට පස්සේ අපි හැමෝම අර ලොකු ගහ ගාවදි හමු වෙමු "යි කියා බෙන් විශාල ගහක් පෙන්විය " දැන් වැඩ පටන් ගනිමු".

ඉන් පසු ඔවුන් වෙන්විය ඉදිරිපස දොරටුව දෙසට ගිය ජුලී සහ බෙන් ට පෙර දින දක්නට ලැබුණු ස්ථානයේ ම චිත්‍ර ශිල්පියා සිටිනු පෙණුනි ඔහු අසලට ගිය ළමුන් දෙදෙනා ඔහුගෙන් විවිධ ප්‍රශ්න ඇසූහ ඔවුන් දුටු විගස" ඔය ළමයි අදත් මෙහෙ මොකද කරන්නේ?"

"අපි මේ නිකං ආවේ එදා ආවට පස්සේ මෙහෙ ආපහු එන්න හිතුනා "යි කීය.

"ඔයා දැන් කොච්චර කාලෙක ඉදලදමෙහෙට වෙලා චිත්‍ර අඳින්නෙ?" බෙන් ඇසීය.

"දැන් වැඩි කාලයක් නෑ සතියක් විතර ඇති"

"ඔයාගෙ තඟදර කොහෙද තියෙන්නේ" ජුලි විමසීය.

"මේ ළගම තියෙන ගමේ" ඔහු කීය.

"ආ....එහෙමද? අපි එහෙනම් යන්නම්"යි කියා ළමුන් එතනින් පිටව ආහ.

ඒ අතරේ ජෙනා, ජැක් සහ පීටර් ද තම රාජකාරිය අරඹා තිබුණි. මුළු මාළිගාව ම සෝදිසි කළ ඔවුන් එක් කාමරයක තිබී ගිනි ගොඩක් ගසා තිබූ බවට සලකුණු, හමු වූ අතරම රෙදි පොට්ටනියක් වැනි යමක් ද ආහාර දවටන කිහිපයක් ද හමු විය.

නැවත පාර අසල දී හමු වූ කණ්ඩායම එකවර වනාන්තරයෙන් පිට වූහ."අපි ඉක්මනට යමු මඩුවට ගිහිල්ලා කතා කරමු" කී බෙන් ගමන වේගවත් කළේ ය.

මඩුවට රැස් වූ ඔවුහු, දුටු දේවල් සහ අහන්න ලැබුණු දේවල් එකිනෙකාට පැවසූහ. ඉන් පසු ඇරඹුවේ බෙන්ය.

"හරි මගේ සැලසුම මේක හැබැයි මේ ක තව ටිකක් ඉදිරියට ගොඩ නගන්න ඕන. මෙහෙමයි මමයි පීටර් සහ ජැක් අපි තුන්දෙනා අද රෑට මාලිගාවට යන්න ඕන ඔය දෙන්නට එන්න පුළුවන්ද? අම්මලට කියන්න අපෙ ගෙදර එනවා කියලා පුළුවන්ද?" බෙන් විමසීය.

"පුළුවන්" යයි පීටර් සහ ජැක් පිළිතුරු දුන්හ.

"එතකොට මටයි ජූලිටයි මොකද වෙන්නෙ අපිටත් එන්න ඕන"ජෙනා කීය.

"ඔය දෙන්නව මේ රෑ එක්ක යන්න බෑ ඒ වුණත් ඔයාලට කරන්න ලොකු වැඩක් තියෙනවා ඒ තමා අපි ගිහිල්ලා විනාඩි 15කට පස්සෙ තාත්තට කියන්න අපි කොහෙද ගියෙ කියලා ඊට පස්සෙ තාත්තගෙන් දුරදක්නය ඉල්ලගෙන මාලිගාව පැත්ත බලාගෙන ඉන්න අපි සංඥා ලබා දෙනවා හරිද? ටෝච් එළිය එක දිගට උඩට පල්ලෙහට යනවා නම් අපි හොඳින් ටෝච් එළිය නිවෙනවා පත්තුවෙනවා නම් ඉතා ඉක්මනින් උදවු ඕන. හදිසි උදවු එළයක් එහෙම දැක්ක ගමන් තාත්තට කියන්න ඉක්මනට එන්න කියලා නැත්තම් අපි අමාරුවෙ තේරුනානේ එහෙනම් අපි හවස 6.30ට මඩුව ළඟදි හමු වෙමු" කී බෙන්ගෙ කතාව අවසන් වූ පසු සියලු දෙනා විසිර ගියහ.

නැවත හවස 6.30 වන විට සියලු දෙනා මඩුව අසලට රැස් විය. ඉන් පසු බෙන් , පීටර් සහ ජැක් මාලිගාවට ගමන ආරම්භ කළහ.

"ඔයාල හරියට ම වැඩේ කරන්න ජෙනා, ජූලි ඔයාලට මතකයිනේ නැත්තම් අපි අමාරුවේ"බෙන් කීය.

"ඔයාල පරිස්සම් වෙන්න"ජෙනා සහ ජූලි කීහ.

ජෙනා කලින්ම අම්මාට සවස් වරුවේ ජූලි පැමිණෙන බව පැවසූහ. ජූලි සමග නිවසට පැමිණි ජෙනා මද වෙලාවකට පසු ජෙනා සහ ජූලි පියාගේ කාමරයට ගියහ. අම්මා ද එහි විය තම හඩ පළමුව අවදි කළ ජෙනා ,

“තාත්තේ පොඩ්ඩක් මේක අහනවද? ”යි කියා සිද්ධිය විස්තර කර පැවසීය. එය ඇසූ පියා “මේ ළමයින්ට නම් පිස්සුද කොහෙදමට ඔය සංඥා ලැබෙනකම් ඉන්න බෑ මම දැම්ම යනවා” කී පියා නිවසින් පිටව ගියේ ගෙවත්ත භාර සේවකයා සහ තවත් අයෙකු සමගයි.

ඉන් පසු ජෙනා සහ ජූලි තාත්තාගේ දුරදක්නය ගෙන මාලිගාව දෙස බෝහෝ වේලාවක් මාරුවෙන් මාරුවට දෑස් වෙහෙසමින් බලා සිටියහ.නමුත් සංඥාවක්නම් නොවීය.

බෙන්, පීටර් සහ ජැක් මාලිගාවට සෙමෙන් ඇතුළු වී මුල්ලකට ගුළි වී මද වෙලාවක් බලා සිටියහ.එවිට චිත්‍ර ශිල්පියා සෙමෙන් ඉදිරියට පැමිණියේය. ඉන් පසු මාලිගාවේ දොරටුව

අසලට ගිය ඔහු ලාම්පුවකින් කිසිවෙකුට සංඥා කළේය. ඒ සංඥාවට අනෙක් පසින් ද ලාම්පු එළියකින් පිළිතුරු ලැබීය. ඒත් සමගම තවත් මිනිසෙක් පැමිණියේය. ළමුන් තිදෙනා මිනිසුන් කතා කරමින් සිටින විට සෙමෙන් චිත්‍ර ශිල්පියාගේ කුටියට පිවිසුණහ. ඉන් පසු ඔහු නිදාසිටියායි සිතිය හැකි කොට්ටය ඔසවා බැලූ විට සිතියම එහි විය. ඉක්මනින් එය තම කබා සාක්කුවට දමාගත් බෙන් තම සගයෝ සමග මාලිගයෙන් පිටවීමට සූදානම් වන විට මිනිසුන් දෙදෙනා මුහුණට මුහුණ හමු විය. ඔවුන් තිදෙනා පැන දිවීමට උත්සහ කළද එය ඉතා අසාර්ථක උත්සහයක් විය. ඔවුන් තිදෙනාව අල්ලා ගත් මිනිසුන් දෙදෙනා ඔවුන්ව බිම් කුටියකට තල්ලු කළහ. ඉන් පසු එහි දොර අසල චිත්‍ර ශිල්පියා රැඳී සිටියේය.

ඒ අතර අනෙක් පුද්ගලයා සිතියම සොයන්නට විය. නමුත් ඔහුට සොයා ගත නොහැකි වූ කල්හි ඔහු දොර අසල සිටි චිත්‍ර ශිල්පියා යැවීය. ඔහු තැබූ තැන සිතියම නැති බව දුටු විට තමන් තිදෙනා අසලට පැමිණෙන බව දන්නා නිසා බෙන් ඉක්මනින් සිතියම අසල වූ කුහරයක සැගවීය. වේගයෙන් දිව ආ චිත්‍ර ශිල්පියා

“කෝ සිතියම ?කොහෙද දැම්මේ? දෙනවා ඒක ආපහු” යි තර්ජනාත්මක හඩින් කීය.

තමාට සංඥාව ලබා දීමට නොහැකි වූ නිසා බෙන්ගේ පියා නොපැමිණෙයි යයි සිතමින් සිටි පිරිමි ළමුන්ගේ සිතට සැනසිල්ලක් ගෙන දෙමින්

“මගේ ළමයින්ට ඔහොම කතා කරන්න ඔහේ කවුද?”කියමින් බෙන්ගේ පියා පැමිණියේය.ඒත් සමගම චිත්‍ර ශිල්පියාගේ දෑත් කඹයකින් තද කර ගැට ගසා අනෙක් පුද්ගලයාද සමග ගෙවත්ත භාර සේවකයා සහ අනෙක් කැඳවාගෙන ආ පුද්ගලයා සමඟ වෑන් රියක නංවා පොලීසියට යැවීය.

සිතියමද රැගෙන කාරය වෙත පැමිණි ළමයි පියාත් සමඟ නිවසට ගියහ. සිතියම සොයා ගැනීමේ සතුටත් සමඟම ඔවුන් එය පසුදින ක්ලැඩිෆ් මහත්තයාට භාර දුන් අතර ඔහු ඔවුන්ට බෙහෙවින් ස්තුති කළ අතර රසකැවිලි පෙට්ටියක් ද ලබා දුන්නේය.

"තවත් වික්‍රමයක් අවසන් වුණා" බෙන් කීය.

## නිමි

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සම්බළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)